12

00291

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී උපාධි වැඩසටහන -2019/2020
අවසාන පරීක්ෂණය - තෙවන මට්ටම (දෙවන වාරය)
**SSU1198 /DSU3298** - ශ්‍රී ලංකාවේ සමාජය පිළිබඳ හැඳින්වීමක්

කාලය : පැය දෙකයි (02)

දිනය: 21.12.2019 වේලාව: ප.ව 1.30 ප.ව 3.30

උපදෙස්:

ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න. සෑම පිළිතුරකටම ලකුණු 25ක් ලැබේ.

1. බටහිර ජාතීන් ශ්‍රී ලංකාව ඔවුන්ගේ අණසකට නතුකර ගත්තේ ඇයි? මෙම ප්‍රශ්නය යටත් විජිත යුගයට ආදාල කරගෙන සාකච්ඡා කරන්න.

2. පාර්ලිමේන්තු පාලනක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ මොනවද? සාකච්ඡා කරන්න.

3. දේශපාලන විශ්ලේෂකයන්ට අනුව "මෑතකදී පැවති මැතිවරණ ප්‍රථිඵල වලින් පෙනී යන්නේ ශ්‍රීලාංකික ජනතාවට ශක්තිමත් ජනපති වරයෙකු බලාපොරොත්තු වූ බවය" මෙම ප්‍රකාශනය සළකමින් විධායක ජනපති පාලන ක්‍රමයක ඇති යහපත් හා අයහපත් ලක්ෂණ සාකච්ඡා කරන්න.

4. අපි ජන වාර්ගික කණ්ඩායමක් විස්තර කල යුත්තේ කෙසේද? සමාජය විසින් මේ සඳහා භාවිතා කරන විවිධ නිර්ණායක වලට අවධානය යොමු කරමින් විස්තර කරන්න.

5. ශ්‍රීලංකාවේ වාසය කරන බහුතර මෙන්ම සුළුතර ජන කොටස් මෙරට බහු සංස්කෘතික රටක් ලෙස පිළිගැනීමට අකමැත්තක් දක්වන බව පෙනී යයි. මෙම පසුබිම යටතේ බහු සංස්කෘතික රටක ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න.

6. රාජ්‍යක බලය වෙන්කිරීම හා මානව නිදහස යන කරුණු දෙක එකට ගමන් කළයුතු බව මොන්ටෙස්ක්‍යු දැඩිව විශ්වාස කළේය. ජීවිතය පිළිබඳව ඔබගේ නිරීක්ෂණයන්ට අනුව මෙම කරුණු ලාංකික සමාජයට කොතරම් වලංගුවනවාදැයි සාකච්ඡා කරන්න.

7. සිංහල හා දෙමළ ඥාති ක්‍රමයන්ගේ සමාන හා අසමාන ලක්ෂණ මොනවාදැයි සාකච්ඡා කරන්න.

8. ස්වභාවික විද්‍යා වෘතිකයන් අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය මුල්කරගත් කවාරාකාර හෝ ශ්‍රම විභාජනයක් තිබේද? අදාල උදාහරණ වලට අවධානය යොමු කරමින් විස්තර කරන්න.

9. පහත සඳහන් මාතෘකා අතුරින් ඔබ කැමති මාතෘකා පහක් (05) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ශ්‍රී ලංකාවේ වාසය කරනු ලබන ජාතික-ආගමික කණ්ඩායම්

ii. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය හා විධායක ජනපති ක්‍රමය අහෝසි කිරීම

iii. ශ්‍රී ලංකාවේ කැළි කසළ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් සොයාගැනීම

iv. ශ්‍රී ලාංකික තරුණ කොටස් විසින් වීථි වල ඇති තාප්ප වල චිත්‍ර ඇඳීමේ නූතන සංස්කෘතියයි

v. අප සමාජයේ එදිනෙදා ගැටළු විසඳීම සඳහා සමාජ හා ස්වාභාවික විද්‍යාවල එකමුතුවක අවශ්‍යතාවය වේ.

vi. ශ්‍රී ලංකා හා විශ්ව සමාජවල සම්බන්ධතාවයන්

vii. සංවර්ධනයේ හා පරිසරයේ සම්බන්ධතාව

*********සියලුම හිමිකම් ඇවිරිණි*********